# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/25 - 2022 අගෝස්තු මස 03 වැනි බදාදා - 2022.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (මෙහි මින්මතු "SDP පනත" යනුවෙන් හඳුන්වනු ලබන) 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නියමය මගින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම් -

(1) ඉහත කී පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇත්තාවූ ද, අංක 752, ඔරියන් සිටි, කොළඹ යන ලිපිනයේ සහ සිනමන් ලයිෆ්, අංක 05, විනිසුරු අක්බාර් මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටා ඇත්තාවූ ද HCL ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අපනයනය සඳහා තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණ සඵල සේවා සැපයීම සඳහා වූ ව්‍යාපෘතිය පිළිබඳ අදාළ තොරතුරු අන්තර්ගත නිවේදනය 2022.01.18 දින අංක 2263/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබී ය.

(2) දැනටමත් උපලබ්ධිවී ඇති එ. ජ. ඩො. මිලියන 10.25 ක ආයෝජනයක් සහිතව සහ 2032 වර්ෂය වන විට දේශීය තැනැත්තන් 5,325 ක් සඳහා තාක්ෂණික ලෙස සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ (IT) සේවා නියුක්ත අවස්ථා සැපයීමක් සහිතව අපනයනය සඳහා තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය සඵල සේවා සැපයීම සඳහා HCL ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගැනීම සඳහා සහ එකී පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව එම ව්‍යාපෘතිය සඳහා බදු නිදහස් කිරීම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ඉහත කී පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව 2022.06.27 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

(3) ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය ''HCL ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්'' (මෙහි මින්මතු ''ව්‍යාපෘතිය'' යනුවෙන් හඳුන්වනු ලබන) යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ වන්නේය.

1A - PG 5921 — 456 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**(1) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

**(අ) සංස්ථාපිත ආදායම් බද්ද (CIT) ගෙවීමෙන් නිදහස් වීම.**

SDP පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව සාදනු ලබන නියමය SDP පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලබන වසර දොළහක (12) කාලසීමාවක් සඳහා සංස්ථාපිත ආදායම් බද්ද ගෙවීමෙන් නිදහස් වන්නේය. ඉහත කී වසර දොළහක (12) බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව අවසන් වීමෙන් අනතුරුව, ව්‍යාපෘති සමාගමේ ව්‍යාපෘතිය විසින් උපයනු ලබන ලාභ සම්බන්ධයෙන් එම අවස්ථාවේදී බලපැවැත්වෙන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය අදාළ විය යුතුය.

**(ආ) සහනදායි බදු අනුපාතිකය**

ඉහත කී වසර දොළහක (12) බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව අවසන් වීමෙන් අනතුරුව එළඹෙන වසර පහක (5) කාලසීමාවක් සඳහා, ව්‍යාපෘතියේ අනුමත ක්‍රියාකාරකම් තුළින් උපචිතවන බදු අයකළ හැකි ලාභ සහ ආදායම් මත, එම අවස්ථාවේ බලපැවැත්වෙන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකයෙන් සියයට පනහක (50%) බදු ප්‍රමාණයක් අදාළ විය යුතුය.

**(ඇ) සේවා නියුක්තිය මත ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වීම**

ඉහත කී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවා නියුක්තියෙන් ලැබෙන ඉපයීම් සහ ලාභ තුළින් උපචිත වන ආදායම් බදු ගෙවීමෙන් වසර පහක (05) කාලසීමාවක් සඳහා උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් විසි දෙනෙකුට (20) යටත්ව ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් නිදහස් වන්නේ ය.

**(ඈ) ලාභාංශ බද්ද**

බදු ගෙවීමෙන් නිදහස්වන ලාභය තුළින් කොටස් හිමියන් වෙත බෙදා දෙනු ලබන ලාභාංශ මත, වසර දොළහක (12) සංස්ථාපිත අදායම් බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව තුළ දී සහ ඉන්පසුව එළඹෙන එක් වසරක් (01) සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

**(2) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත**

සේවාවලින් උපචිතවන ආදායමෙන් සියයට අනූවකට (90%) වඩා වැඩි ප්‍රමාණයක් පරිවර්තනය කරනු ලැබිය හැකි විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන බවට වූ තවදුරටත් වූ කොන්දේසියට යටත්ව, SDP පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව සාදනු ලබන නියමය SDP පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලබන වසර දොළහක (12) කාලසීමාවක් සඳහා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මෙහි මින්මතු "BOI" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම අයිතම ආනයනය කිරීම සම්බන්ධයෙන් (යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, උපාංග සහ ඉදිකිරීම් අයිතම) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත සහ එහි සංශෝධන යටතේ එකතුකළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් සහ අය කිරීමෙන් ව්‍යාපෘතිය නිදහස් වන්නේය.

**(3) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත**

SDP පනතේ 3(4) වන වගන්තිය ප්‍රකාරව සකස් කරනු ලබන නියමය SDP පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලබන වසර දොළහක (12) කාලසීමාවක් දක්වා ආනයනය කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම මත (යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, උපාංග සහ ඉදිකිරීම් අයිතම) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතේ සඳහන් වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) ගෙවීමෙන් සහ අය කිරීමෙන් ව්‍යාපෘතිය නිදහස් වන්නේය.

**(4) රේගු ආඥාපනත (235 වන අධිකාරය)**

සේවාවලින් උපලබ්ධි වන ආදායමෙන් සියයට අනූවකට (90%) වඩා වැඩි ප්‍රමාණයක් පරිවර්තනය කරනු ලැබිය හැකි විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන බවට වන තවදුරටත් වූ කොන්දේසියට යටත්ව, SDP පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව සකස් කරනු

ලබන නියමය SDP පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී ආනයනය කරන (යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, සහ ඉදිකිරීම් අයිතම) ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම මත (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ සඳහන් පරිදි රේගු ආනයන බද්ද (CID) අයකිරීමෙන් සහ ගෙවීමෙන් ව්‍යාපෘතිය නිදහස් වන්නේය.

එසේ වුවද, අසාදු ලේඛනයේ සඳහන් අයිතම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය නොකරන අවස්ථාවක දී හෝ ප්‍රමාණවත් තත්ත්වයෙන්, ප්‍රමාණයෙන් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව ඇතුළත නොපවතින අවස්ථාවක දී එම අසාදු ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සලකා බලනු ලැබිය යුතුය.

(5) **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

SDP පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව සාදනු ලබන නියමය SDP පනතේ 3(5) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට ගණනය කරනු ලබන වසර දොළහක (12) කාලසීමාවක් සඳහා, ආනයනය කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම මත (යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, උපාංග සහ ඉදිකිරීම් අයිතම) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ සඳහන් සෙස් බද්ද (CESS) ගෙවීමෙන් සහ අය කිරීමෙන් ව්‍යාපෘතිය නිදහස් වන්නේය.

ව්‍යාපෘතිය විසින් ආනයනය කිරීමට නියමිත අයිතමවල ප්‍රමාණයන් සහ වටිනාකම් සම්බන්ධයෙන් වූ ඉහත (2), (3), (4) සහ (5) වන වගන්තිවල සඳහන් බදු නිදහස් කිරීම් BOI හි පූර්ව අනුමැතිය ලබාගැනීමට යටත්ව සිදු විය යුතුය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 03 වැනි දින,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

EOG 08-0101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.